# ජාතික අධ්‍යාපන ආයතනය
# දෙවන භාෂාවක් ලෙස සිංහල/දෙමළ ඉගැන්වීමේ ඩිප්ලෝමා පාඨමාලාව
## Diploma in Teaching Sinhala /Tamil as Second language - 2019
## ( SLQF Level 3)

ජාතික අධ්‍යාපන ආයතනයේ ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවනු ලබන දෙවන භාෂාවක් ලෙස සිංහල/දෙමළ ඉගැන්වීම පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ 2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා පාඨමාලාලාභීන් බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. ප්‍රවේශ සුදුසුකම්**

- විශ්ව විද්‍යාලයක/ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයක/රජයේ අධ්‍යාපන ආයතනයක/රජයේ හෝ රජය අනුමත පෞද්ගලික පාසලක/පිරිවෙනක දෙවන බස සිංහල/දෙමළ උගන්වන කථිකාචාර්යවරයෙකු/ගුරු භවතෙකු වීම.

**02. පාඨමාලාවේ ස්වභාවය**

- අර්ධ කාලීන පාඨමාලාවක් වන අතර එක් අවුරුදු පාඨමාලාවකි. සති අන්ත හා පාසල් නිවාඩු කාලවල දී සම්මුඛ සැසි පැවැත්වේ.

**03. පාඨමාලා ගාස්තු**

| | |
|---|---|
| අයදුම් කිරීමේ ගාස්තුව | රුː 500 |
| ලියාපදිංචි ගාස්තුව | රුː 1000 |
| පාඨමාලා ගාස්තුව | රුː 30,000 |

- පාඨමාලා ගාස්තු සමාන වාරික දෙකකින් ගෙවීමට හැකියාව ඇත.
- පාඨමාලාවට ලියාපදිංචි වීමේ දී ලියාපදිංචි ගාස්තුව රුː 1000/- සමඟ සම්පූර්ණ පාඨමාලා ගාස්තුව හෝ එක් වාරිකයක් ගෙවිය යුතු වේ.
- පාඨමාලාව අවසානයේ පැවැත්වෙන අවසාන පරීක්ෂණය සඳහා විභාග ගාස්තුව පාඨමාලාලාභියා විසින් ගෙවිය යුතු ය.

**04. තෝරා ගැනීම**

මූලික සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් සම්මුඛ පරීක්ෂණයකින් පසු තෝරා ගනු ලැබේ.

**05. පාඨමාලාව පවත්වනු ලබන ස්ථානය :-**

ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.

**06. අයදුම් කිරීම**

සම්පූර්ණ කරන ලද අයදුම්පත සමඟ දිවයිනේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් අධ්‍යක්ෂ ජනරාල්ගේ ගිණුම් අංක 607628 ට රු. 500/= ක මුදලක් බැර කර ලබා ගත් කුවිතාන්සියේ මුල් පිටපත සහ නම හා ලිපිනය ලියූ රු.15/= ක් වටිනා මුද්දර ඇලවූ 9''4'' ප්‍රමාණයේ ලියුම් කවරයක් ද සමඟ 2019.02.22 දිනට පෙර **''අධ්‍යක්ෂ, ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම ''** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. **(මුදල් ගෙවීමේදී මුදල් ඇණවුම් හෝ ලංකා බැංකුව හැර වෙනත් බැංකුවකට බැර කරන ලද මුදල් භාර ගනු නොලැබේ.)**

2019.02.18 දිනට පසුව ලැබෙන අයදුම්පත්, මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඉල්ලුම්පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"Dip in TSTSL "** යනුවෙන් සඳහන් කරන්න.

ආදර්ශ අයදුම්පත් **www.nie.lk** වෙබ් අඩවියෙන් ලබා ගත හැකි ය.

ආචාර්ය ටී.ඒ.ආර්.ජේ.ගුණසේකර
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය